**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත අනුව ස්වයං මැදිහත්වීමක් සිදුකිරීම සඳහා පවතින ප්‍රතිපාදන අනුව විගණකාධිපතිවරයා විසින් සීනි බදු සම්බන්ධයෙන් පවතින ගැටළුකාරී තත්වය පිළිබඳව කරුණු ඇතුළත්ව ඉදිරිපත් කර ඇති වාර්තාවක් අදාළ කර ඊයේ දින ජනමාධ්‍ය වෙතින් ඉදිරිපත් වූ කරුණු කෙරෙහි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය අවධානය යොමු කර ඇත.

ඒ අනුව රාජ්‍ය බලය අයුතු ලෙස සහ අත්තනෝමතික ලෙස භාවිතා කිරීම ඔස්සේ ශ්‍රී ලාංකික පුරවැසියන්ගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික අයිතිවාසිකම් උල්ලංඝනය වීමට ඉඩ ඇති බැවින් රජය විගණකාධිපතිවරයා විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් ලබාදී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම සිදුකළ යුතු බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපති ලෙස රජයට අවධාරණය කරන්නෙමු.

විනිසුරු රෝහිණී මාරසිංහ
විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු / සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2022.04.18